නමෝ බුද්ධාය


දාහ නව වෙනි වෙළුම

ආරම්භය: 2001-07-05 | මාසික ධර්ම සංග්‍රහය අංක: 185

ශ්‍රී. බු. ව. 2559 | 2015 ඔක්තෝබර් 27 | වප් කළාපය


# වෛරයේ ගිනි සිළු නිවාලමු මෙත් දියෙන්


හොරණ රජ මහා විහාරවාසි

## අතිපූජ්‍ය හොරණ ජිනානන්ද නා හිමිපාණන් වහන්සේ විසිනි


නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස ///

නහි වේරේන වේරානි - සම්මන්තීධ කුදාචනං
අවෙරෙනච සම්මන්ති - එස ධම්මෝ සනන්තනෝ

(ධම්ම පදය - යමක වග්ගය 5)

වත්මන් ලාංකීය ජන සමාජයෙහි දිනෙන් දින වැඩිවන අපරාධ පළිගැනීම් හා ඇණකොටා ගැනීම් මෙන්ම සාපරාධී ක්‍රියා එසේ සිදු වීමට හේතු කාරක සොයා බැලීමේදී ඉහත සඳහන් බුද්ධ වචනනය ක්‍රියාවට නො ගැනීමේ ඵල විපාක පැහැදිලි වේ.

යථෝක්ත බුද්ධ දේශනාව මෙයට වසර දෙදහස් පන්සියයක් පමණ පැරණි වුවද එහි කිසිදු අයුරකින් ගුණාත්මක වශයෙන් පැරණි ස්වරූපයක් ගෙන නැත. එයට හේතු වශයෙන් අප දකින්නේ ක්‍රි.පූ. 6 වන සියවසේ පහළ වූ ඒ අසිරිමත් සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේගේ බුද්ධ දේශනය තුන් කලටම සත්‍ය වන අයුරින් දේශනා කර තිබේ. නූතන සමාජයේ බොහෝ දුක් ගැටලු වලට පාත්‍රව වෙසෙන මනුෂ්‍ය ජීවිතයේ ප්‍රකෘති ස්වභාවය තුළින් ධාර්මික ජිවනෝපාය අනුව ගත කිරීමට උත්සුක වන බොහෝ දෙනාට ඉහත ගාථාවේ ඇති උත්තුංග බව මෙන්ම ගුණධර්ම පුරුදු පුහුණු වීමට අවශ්‍ය තොරතුරු ඉතා වැදගත් වේ.

මේ උතුම් බුද්ධ වචනය ඇතුළත් වන්නේ ධම්ම පදයේ යමක වග්ගයෙනි. මෙය අප ශාන්ති නායක තථාගතයන් වහන්සේ සැවැත් නුවර ජේතවන විහාරයෙහි වැඩ සිටියදී එක්තරා වඳ ස්ත්‍රියක් මුල්කොට දේශනා කළ සේක. මෙම ගාථාවෙහි සරල අදහස වනුයේ කිසිදා වෛරයට වෛර කිරීමෙන් එය සංසිඳීමක් නැති බවත්, වෛර කරන්නාට අවෛර කිරීමෙන් පමණක් වෛරය සංසිදෙන බවත්ය.

මෙහි එන නිදාන කතාවද වෛරය ඇති සත්වයාගේ සසර ගමන කෙතරම් දුක්ඛදායී ආකාරයට රැගෙන යන්නේද කියා මනාව පැහැදිලි කරයි. දෙව්රම් වෙහෙර සමීපයේ අඹුසැමි දෙපළක් වාසය කලා. ඔවුන්ට එක් කුල පුත්‍රයෙක් සිටියා. පියා මිය යෑමෙන් අනතුරුව මවගේ ඉල්ලීම පරිදි පුතා භාර්යාවක් ද ගෙනාවා. ඇය දරුඵල නැති තැනැත්තියෙකි. මව තම පුතාට තව භාර්යාවක් ද ගෙනාවා. කල් යාමේදී ඇයට දරු සම්පතක් ඇති විය. මේ කරුණ කෙරෙහි වෛර සිතක් ඇති කරගත් වඳ භාර්යාව

කල්පනා කලා "මැයට දරුවන් ලැබුණොත්, මාව මෙහෙකාර කමට ගනියි. සියලු වස්තුව ඇයට හිමිවෙයි" කියා එසේ සිතා මිත්‍ර ලීලාවෙන් දරු සම්පත නැති කිරීම සඳහා උපාය යෙදුවා. දෙවැනි වතාවේද දරු ගැබක් හටගෙන ඇති බව දැන එයද විනාශ කිරීම සඳහා උපාය යෙදුවා.

තෙවැනි වර දරුවකු පිළිසිඳගත් බව ඇයට නොකියාම සිටියා. මහත් වූ උදරය දුටු වඳ භාර්යාව කල්පනා කළා "ඇය මට මෙවර දැන්නුවේ නැහැ නමුත් මා මෙවරද දරු ගැබ විනාශ කරනවා" කියා එම අදහස ඇතිව ආහාර සමඟ විෂ බෙහෙත් දුන්නා. මෝරා ඇති දරු ගැබ හෙළීමට නොහැකි විය. දරුවාද මිය ගියේය.

එහිදී ඇය "තී මගේ දරුවන් තුන්දෙනාත් නැසුවා. දැන් මාත් නැසෙයි. මා මෙයින් නික්ම දරුවන් කෑමට සමර්ථ වෙම්වායි" ප්‍රාර්ථනා කොට මිය ගියා. ඇය මිය ගොස් එම ගෙදරම බැළලියක්ව උපන්නා. සැමියාගේ පහර දීමෙන් වඳ භාර්යාවද මිය ගොස් ඒ ගෙදරම කිකිලියක්ව උපන්නා. කිකිලිය දමන බිත්තර දෙවතාවක්ම මේ බැළලිය කා දැම්මා. තෙවැනි වරද බැලලිය විසින් බිත්තර කා දමන ලදී.

කිකිළිය වෛර බැඳ මිය ගොස් දිවි දෙනක්ව උපන්නාය. බැළලිය මියගොස් මුව දෙනක්ව උපන්නාය. එහිදී මේ දිවිදෙන දෙවතාවක්ම පැටව්ද තෙවැනි වර පැටව් හා මුව දෙනද කා දැම්මාය. මුව දෙන වෛර බැඳ මියගොස් යකින්නියක් වී උපන්නාය.

දිවි දෙන මියගොස් සැවැත් නුවර කුල දුවක්ව උපන්නාය. යකින්නිය විසින් පෙර සේ දෙවතාවක්ම කුලදුවගේ දරුවන් කා දමන ලදී. තමන්ට අත් විඳින්නට වූ විපත් දැන ගත් ඇය තෙවැනි වර දරු ගැබක් හටගත් පසු තම මවගේ ගෙදරට ගියාය. දරුවාගේ උත්පත්තියෙන් සත්වැනි දින නැවතත් තම නිවස බලා යන්නේ දෙවුරම් වෙහෙර සමීපයේ ඇති ගඟකින් නෑවාය. භාර්යාව නා දරුවා අත තබාගෙන කිරිදෙමින් සිටියි. දියවරෙන් මිදුණු යකින්නිය වහා ගෙදරට ගොස් යෙහෙළිය කොහිදැයි විමසුවාය. එහි නැති බව දැනගෙන "ඈ කැමති තැනක ගියාවේ.

මගෙන් බේරීමක් නම් නැතැයි වෛරයෙන් යුක්තව නුවර බලා යන්නීය. වේගයෙන් එන යකින්නිය හඳුනාගත් කාන්තාව දරුවා ද රැගෙන ඇතුළු විහාරයට දුවගෙන ගියාය. බුදුරජාණන් වහන්සේ පිරිස මැද දහම් දෙසමින් වැඩ සිටියාහුය. එහිදී "ස්වාමිනි මේ දරුවා ඔබ වහන්සේට පූජා කරමි. මගේ පුතාට ජීවිත දානය දෙනු මැනව" යි ඉල්ලා සිටියාය. විහාර දොරටුවෙන් ඇතුළු වීමට බැරිවූ යකින්නිය බුදුන් වහන්සේගේ නියමයෙන් අනඳ හිමි විසින් කැඳවාගෙන ආවේය. යකින්නිය පැමිණි පසු "ඇයි මෙසේ කරන්නේ ඉදින් තෙපි බුදු කෙනෙකු හමුවට ආවේ නැත්නම් නයින් මුගටින්, කපුටන් බකමූණන්, සේ කල්පස්න වෛරය මෙන් වන්නේ නොවේද? කුමන නිසා වෛරයට නැවතත් වෛර කරන්නාහුද?" යන ලෙසින් බුදු රදුන් ධර්මය දේශනා කොට දෙපක්ෂයටම සෙත සැලසූහ.

මෙම කරුණු විමසීමේදී හැම තැනකම ඇතිවූ හේතූන්ට මුල බීජය පළි ගැනීම, ක්‍රෝධය හෙවත් වෛරයයි. සෙම සොටු, මල මුත්‍ර ආදියෙන් අපවිත්‍ර වූ ස්ථානයක් එයින්ම පිස දැමුවොත් එතැන තව තවත් අපවිත්‍ර වෙනවා. පිරිසිදු ජලය වැනි දෙයකින් සෝදා දැමීම තුළින් එය පිරිසිදු කරගත හැකි වනවා සේ ක්‍රෝධය නැමැති පහත් සිතිවිල්ල මෛත්‍රිය නැමති ජලයෙන් සෝදා හළ යුතුය.

ක්‍රෝධ කිරීම නිසා ශරීර වර්ණයද අවලක්ෂණ වන බව මල්ලිකා බිසවගේ චරිතයෙන් ඉගෙන ගත හැකිය. ශරීර වර්ණයට කැමැති පුද්ගලයා වෛර නොකළ යුතුය.ධර්මයේ ක්‍රෝධය පිළිබඳ දීර්ඝ ලෙස විස්තර කර ඇත. එය ඇති වීමට කරුණු නවයක් හේතුවන බව ද දක්වා ඇත. තම හට පෙර අනර්ථයක් කිරීම තම හට දැන් අනර්ථයක් කිරීම, තම හට මතු අනර්ථයක් කිරීම, තම හිතවතකුට පෙර අනර්ථයක් කිරීම, තම හිතවතකුට දැන් අනර්ථයක් කිරීම, තම සතුරකුට දැන් අනර්ථයක් කිරීම තම සතුරෙකුට මතු අනර්ථයක් කිරීම යනු වෙනි. නව වැදෑරුම් වූ මෙයට නවඝාත කර්මය යැයි ද කියනු ලැබේ. මෙයටම අස්ථාන ක්‍රෝධයද එකතු වී දසඝාත වස්තුව වශයෙන් ද දක්වා ඇත.

දෙලොව දියුණුව කැමැති හැම දෙනා විසින්ම ඇති කර ගත යුතු උසස් ධර්ම වලින් එකක් ලෙස ඉවසීම දැක්විය හැකිය. මංගල කරුණු අතර ඉවසීම එක් මංගල කරුණකි. දසරාජ ධර්ම අතර ඉවසීම එක් රාජ ධර්මයකි. **"කුද්ධො අනත්ථං න ජානාති, කුද්ධෝ ධම්මං න පස්සති"** ක්‍රෝධ මිනිසාගේ ප්‍රකෘති සිහිය වෙනස් කොට උන්මත්තකයෙකු බවට පත් කරන පාප ධර්මයකි.

එක් අවස්ථාවකදී අක්කෝසක භාරද්වාජ බමුණා බුදුරදුන් වෙත පැමිණ **"කිංසු කද්ධත්වා සුඛං සේති කිංසු** කද්ධත්වා **න සෝචති"** යනුවෙන් කුමක් නිසා සුවසේ වෙසේද? කුමක්ද නිසා ශෝක නො කෙරේද?" යි ඇසිය. මෙසේ බමුණාට පිළිතුරු දෙන බුදුන් වහන්සේ **"ක්‍රෝධ කද්ධත්වා සුඛං සෙති, ක්‍රෝධං කද්ධත්ව න සොචති"** යනුවෙන් ක්‍රෝධය නසා සුවසේ වෙසේ ක්‍රෝධය නසා ශෝක නොකෙරේ" යනුවෙන් පිළිතුරු දුන් සේක. මෙයින් පෙනී යන්නේ අප පිළිකුලින් පහ කළ යුතු අවැඩ පිණිස පවතින පහත් සිතුවිලි මත වෛරය ක්‍රෝධය අවැඩක්ම කරන බවයි. **"වධං අරියා පසන්සන්ති"** අමිහිරි විපාක ඇති ක්‍රෝධය නැසීම ආර්යයන් වහන්සේ ප්‍රශංසා කරනවා යන්න මෙහි අදහසයි.

තම සිතෙහි වෛරය ක්‍රෝධය ආදී සිතිවිලි පැමිණි කළ ප්‍රඥාවන්තයා එයින් මිදී තම සිත සැහැල්ලු කර ගනී. එසේ ඉවසීමේදී ආනිශංසය පහක් ඇති වන බව අංගුත්තර නිකායේ පංචක නිපාතයේ දක්වා ඇත.

ඉවසන තැනැත්තා බොහෝ දෙනාට ප්‍රිය මනාප වේ. ක්‍රෝධ සිතිවිලි නැතිවේ. වැරදි අඩුවෙන් කරන තැනැත්තෙක් වේ. මරණයට පත්වන විට සිහි මුලාවෙන් තොරව පිරිසිදු සිහියෙන් යුතුව මරණයට පත්වීමට හැකිවේ. එය මරණින් පසු යහපත් ප්‍රතිසන්ධියක් ඇතිකර ගැනීමටත් දෙව් ලොව ඉපදීමටත් හේතුවේ.

එසේම යමෙක් තම සිතෙහි වෛර චේතනා හෙවත් ක්‍රෝධයක් ඇති වූ විට එයින් මිදී උතුම් හැඟීම් තම සිතෙහි ඇති කර ගන්නේ නම් ඔහු බුදු පසේ බුදු මහරහතුන් ගිය මඟ යන්නෙක් වන්නේ යැයි සඳහන් වේ.

මෙම අදහස් එදාට වඩා අදට අතිශයින්ම වැදගත් වේ. බුද්ධ ධර්මය උපන්දා සිට තම ආගම කරගත් මෙරට ජනයා එම අදහස දේශනයටත්, පොතටත් පමණක් සීමා කොට ගෙන ඇති බව පෙනේ. මෙහි යථාර්ථය මැනවින් අවබෝධ කරගෙන කටයුතු නොකරන බව සමාජයේ පවතින ප්‍රශ්න දෙස බැලීමේදී දක්නට ලැබේ.

අද අප දේශය ගැන සිතා බලන්න. වර්ෂ ගණනාවක සිට නොනවතින ලේ ගංගා සහිත යුද්ධයකි. මෙයට ද මූලික වූ රෝග නිදානය වනුයේ වෛරයයි. ජාතීන් දෙස බලන විට ඔවුන් ද ඇණ කොටා ගන්නා ස්වරූපයක් ගනී. රට රටවල් දෙසු බැලූ විට ඔවුහුද තමන්ගේ බලය වැඩිකර ගැනීම සඳහා අවි ආයුධ තනා යුද්ධ සඳහා උපකාර කරති. අද ඔවුහුද තම ජීවිත භයෙන් මිල කළ නොහැකි වටිනා මිනිස් ජීවිත නැතිකර ගන්නා වූ යුද්ධවලට අවතීර්ණ වී සිටිති. බුදුන් දවස ද ශාක්‍ය - කෝලිය දෙපිරිස අතර රෝහණී නදියේ ජලය බෙදා ගැනීම සඳහා යුද්ධයකට අවතීරණ වූ අවස්ථාවේදී එතැනට වැඩි බුදුන් වහන්සේ විසින් වෛරයේ ආදීනව කියා සමගි සම්පන්න කොට ඔවුන්ට සෙත සලස්වන ලදී.

මිනිසා තුළ ඇතිවන වෛරය නිසා සුළු සුළු වචන හුවමාරු වීම් වලදී ඇතිවන විනාශයන් ද බොහෝ ය. මේ හැම දේකටම හේතුව යම් යම් ප්‍රශ්න ඇති වන විට එකකු පරයා අනෙකා ජය ගැනීමට සිතා ක්‍රියා කිරීමයි. මේ නිසා ඔවුන්ගේ සන්තානයන් තුළ ද්වේශයක් හොවත් පළි ගැනීමේ චේතනාවක් ඇති වේ. මෙ මගින් සාකච්ඡා කොට හොඳ සිතින් විසඳා ගත යුතු බොහෝ ප්‍රශ්න දුර දිග ගොස් වටිනා මිනිස් ජීවිත දස දහස් ගණනින් රටට අහිමි වෙමින් පවතී. දරුවන්ට මව්පියන් අහිමි වෙයි. මව්පියන්ට දරුවන් අහිමි වේ. වටිනා සම්පත් ද විනාශ වේ. මේ සියල්ලටම හේතුව මෝහයෙන් මුලාවී ද්වේශයෙන් අගතියට ගොස් සිටීමයි.

අවසාන වශයෙන් නැවතත් කෙටියෙන් කල්පනා කරන විට මෙම ධර්ම කරුණු ඇතුළත් දේශනය මටත්, ඔබටත් පමණක් නොව ලොව වෙසෙන බෞද්ධ, අබෞද්ධ කොයි කාටත් එකසේ පල ගෙන දෙන්නකි. මෙම බුද්ධ දේශනා ආදර්ශයට ගන්නා සෑම දෙනාටම මෙලොව හා පරලොව අභිවෘද්ධිය සලසා ගත හැකි වන්නේය.

**ඔබ සැමට සම්මා සම්බුදු සරණයි !**